# 2557 - මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

**4 ශ්‍රේණිය** **(07) ඉතිහාසය** **පැ තුනයි**

* පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. වර්තමාන ඉන්දුනීසියාවට අයත් දූපත් 02ක් නම් කරන්න.

ii. ක්‍රි.ව. 5 වැනි සියවසේ මෙරටට පැමිණ අභයගිරි විහාරයේ නැවතී සිටි චීන ජාතික භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

iii. බුරුමයේ වර්තමාන 'තලයින්' නම් ජන කොටස හැඳින්වූ පැරණි නම කුමක් ද?.

iv. හතර වන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා අනුග්‍රහය දැක්වූ කුෂාණ වංශික රජතුමා කවු ද?

v. (අ) 'බෝරෝබුදූර්' විහාරය පිහිටා ඇති රාජ්‍යය නම් කරන්න.
(ආ) මෙම විහාරය කරවන ලද රාජ පරම්පරාව සඳහන් කරන්න.

vi. පැරණි ග්‍රීක දාර්ශනිකයන් දෙදෙනෙකු නම් කරන්න.

vii. යුරෝපයේ දියුණුවට පත්ව තිබූ පැරණි ශිෂ්ටාචාරයන් 02ක් නම් කරන්න.

viii. රෝම ශිෂ්ටාචාරය විනාශ කළ ආක්‍රමණකාරී ජන කොටස් 02ක් ලියා දක්වන්න.

ix. ඇමරිකානු නිදහස් සටනේ පුරෝගාමියා ද, එහි ප්‍රථම ජනාධිපතිවරයා ද වන්නේ කවුරුන් ද යන්න සඳහන් කරන්න.

x. (අ) ක්‍රි.ව.1505 දී ගාලු වරායට ගොඩබට පෘතුගීසි කණ්ඩායමේ නායකත්වය ගත්තේ කවු ද?
(ආ) සෙංකඩගල රාජධානියේ ආරම්භක පාලකයා කවු ද?

(ලකුණු 4x10 = 40)

## II කොටස

02 i. අග්නිදිග ආසියාවට අයත් ථෙරවාදී බෞද්ධ රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

ii. ආසියාවේ මහායාන බෞද්ධ රටවල් 02ක් නම් කර, ඉන් එක් රටක මහායාන ධර්මයේ විකාශනය කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

iii. බුරුමයේ අනවරථ රජුගෙන් එහි බුදු සසුනේ දියුණුවට සිදු වූ සේවය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

03 i. රෝම ශිෂ්ටාචාරයෙන් නූතන ලෝකයට ලබා දුන් දායාද දෙකක් නම් කරන්න. (ලකුණු 04)

ii. යුරෝපයේ මධ්‍යතන යුගයට අයත් කාල වකවානුව සඳහන් කර, මධ්‍යතන යුගය නැවත බෙදා ඇති අවධි තුන නම් කරන්න. (ලකුණු 05)

iii. මධ්‍යතන යුගයේ ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04 i. 'පුනරුදය' මුලින් ම ඇති වූ රට කුමක් ද? (ලකුණු 04)
ii. පුනරුදය ඇති වීමට තුඩුදුන් සාධක කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)
iii. කාර්මික විප්ලවය මුලින් ම ඇති වූ රට නම් කර, එරට කාර්මික විප්ලවය ඇති වීමට බලපෑ හේතු කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05 i. 'ඇමරිකානු විප්ලවය' නමින් හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 04)
ii. මේ ජනපද ආර්ථික වශයෙන් සීඝ්‍ර දියුණුවක් ඇති වීමට බලපෑ සාධක පෙන්වා දෙන්න.(ලකුණු 05)
iii. 'බොස්ටන් තේ සංග්‍රහය' යනු කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 06)

06 i. 16 වන සියවස හෙවත් පෘතුගීසීන් පැමිණෙන විට ලංකාවේ පැවති පාලන මධ්‍යස්ථාන නම් කර, ඉන් ප්‍රධාන පාලන මධ්‍යස්ථානය සඳහන් කරන්න. (ලකුණු 04)
ii. 'විජයබා කොල්ලය' යන්න හඳුන්වා දෙන්න. (ලකුණු 05)
iii. සීතාවක රාජ්‍යය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

07 i. ලන්දේසීන්ගේ මව් රට නම් කර, ඒ රට අයත් මහද්වීපය සඳහන් කරන්න. (ලකුණු 04)
ii. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන් විසින් කරන ලද ශාසනික පුනරුදය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05)
iii. ලන්දේසි පාලන සමයේ මෙරට සංස්කෘතියේ හා ආර්ථික ක්‍රමයේ දක්නට ලැබුණු විශේෂතා පැහැදිලි කරන්න. (ලකුණු 06)